**සමන්තුරේ ප්‍රාදේශීය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

**--------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 23 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 17 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සමන්තුරේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------------

පළාත් පාලන පළාත් සභා අමාත්‍යාංශය ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එල්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂනය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියුයතු රු. 11,500 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) විදුලි ගාස්තු, ජල ගාස්තු හා දුරකථන ගාස්තු සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු එකතුව රු. 65,925 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) 2013 දෙසම්බර් 31 දිනට රු. 152,345 ක් වටිනා විදුලි උපකරණ තොගය ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී යුනෙප්ස් (UNOPS) ආයතනයෙන් ලද කාර්යාල උපකරණ 13 ක වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී විවිධ අය විසින් පරිත්‍යාගය වශයෙන් ලබාදී තිබූ පුස්තකාල පොත් 573 ක වටිනාකමවන රු. 93,231 ක මුදල ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඊ) නිලධාරියෙකුට ලබා දී තිබූ රු. 10,000 ක සුළු මුදල් අග්‍රිමය සමාලෝචිත වර්ෂයෙදී ඔහු විසින් ආපසු ගෙවා තිබුණද එය සුළු මුදල් අග්‍රිම ගිණුමට බැර කර නොතිබූ හෙයින් සුළු මුදල් අග්‍රිම ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) 2005 වර්ෂයේදී අස්ථාන ගතවූ රු. 95,670 වටිනා විදුලි උපකරණ තොගය සමාලෝචිත වර්ෂය අවසානයේ, ගිණුම් ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

(ඌ) ලෙජරය අනුව වත්කම්වල අයිතිය වෙනස් කිරීම සඳහාවූ අයදුම්පත් විකිණීමෙන් ආදායම් රු. 30,100 ක් වුවද, එය ගිණුම් ප්‍රකාශනවල රු. 153,818 වශයෙන් වෙන්වා තිබූ හෙයින් එම ආදායම රු. 123,718 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) ලෙජරය අනුව බවුසර් සේවා ගාස්තු ආදායම් ගිණුමේ ශේෂය රු. 151,900 ක් වූවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු. 30,404 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.3 අවිනිශ්චිත ගිණුම්

2005 වර්ෂය සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අවිනිශ්චිත ගිණුමේ ශේෂය වශයෙන් රු. 6,210 ක මුදලක් දක්වා තිබූ නමුත්, එය හඳුනාගෙන නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

### 1.3.4 ලැබියයුතු ගිණුම්

නිලධාරීන් 28 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 512,706 ක ණය ශේෂය අයකර ගැනීම සඳහා 2014 ජූලි 30 වන දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන අයිතමයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

<table>
<tr><th>අයිතමය</th><th>වටිනාකම<br>රු.</th><th>ඉදිරිපත් නොවූ සාක්ෂි</th></tr>
<tr><td>ඉඩම් හා ගොඩනැගිලි</td><td>10,430,028</td><td rowspan="4">ස්ථාවර වත්කම් ලේඛන, වත්තම් පිළිබඳ විස්තරාත්මක උපලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා</td></tr>
<tr><td>උපකරණ සහ යන්ත්‍රෝපකරණ</td><td>1,269,343</td></tr>
<tr><td>පුස්තකාල පොත්</td><td>749,992</td></tr>
<tr><td>කාර්යාලීය උපකරණ</td><td>114,240</td></tr>
<tr><td>නිරවුල් නොවූ අත්තිකාරම</td><td>585,242</td><td>විස්තරාත්මක උපලේඛන, අත්තිකාරම් ලේඛන සහ වවුචර</td></tr>
</table>

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 17,964,998 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 3,653,917 මුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 14,311,081 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 වරිපනම් හා බදු
-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 134 වගන්ති අනුව ප්‍රාදේශිය සභාවේ බල ප්‍රදේශයතුල තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි මත 2005 වන වර්ෂයේ සිට 2012 වර්ෂය අවසානය දක්වා අයකරගතයුතු එකතුව රු. 6,342,445 වු වරිපනම් බදු වලින් 28% වන රු. 1,800,046 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අයකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අය වැය ලේඛනය අනුව වරිපනම් බදු වශයෙන් අය කිරීම සඳහා ඇස්තමෙන්තු කර තිබු රු. 3,887,719 ක මුදලින් 13% වන රු. 505,403 ක මුදලක් පමණක් අයකර ගෙන තිබුණි.

2.2.2 බලපත්‍ර ගාස්තු
----------------

2003 වර්ෂයෙ සිට 2005 වර්ෂය අවාසානය දක්වා අයකර ගතයුතු බලපත්‍ර ගාස්තු රු. 142,669 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසාන දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 වෙනත් ආදායම්

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තියේ (vii) (8) සහ (xxx) උප වගන්ති සහ 2010 මාර්තු 05 වන දින අංක 1644 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගැසට්පත්‍රයේ දැන්වීම අනුව සහා බලප්‍රදේශයේ පෞද්ගලික ආයතනයන් විසින් ඔවුන්ගේ වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම සඳහා ස්ථාපිතකරන ලද ප්‍රචාරක දැන්වීම් පුවරු 27 වෙනුවෙන් අයවියයුතු රු. 279,990 ක ගාස්තු 2014 ජූලි 10 වන දින දක්වා අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 මාර්තු 05 දින අංක 1644 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය අනුව ප්‍රාදේශිය සභාවේ බල ප්‍රදේශ වල 2009 වර්ෂයේ සිට 2013 දක්වාවූ කාලපරිච්ඡේදය තුල ස්ථාපිතකරන ලද විදුලි සංදේශ කුළුනු 05ක් වෙනුවෙන් අයවියයුතු රු. 410,000 ක බලපත්‍ර ගාස්තු 2014 ජූලි 10 දින දක්වා අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2003 සිට 2012 වර්ෂය දක්වා හිඟව තිබූ මස්කඩ බදු මුදල වන රු. 12,239,621 ක මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) මහජන පොළ කඩ කාමරවල බදුකරුවන් ගෙන් 2005 සිට 2012 වර්ෂය දක්වා හිඟව පැවති රු. 1,813,278 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ අයකර 2012 අවසානය දක්වා තැන්පතු ගිණුමේ පෙන්වා තිබූ එකතුකළ අගය මත බදු සහ රඳවාගැනීමේ බදු එකතුව රු.53,874 ක මුදල දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර ආදායම් ගිණුමට මාරුකර තිබුණි.

(ආ) 2006 සහ 2007 යන කාල පරිච්ඡේදය තුල අයකර තිබූ සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල වන රු. 62,768 ක් සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය නොකර ආදායම් ගිණුමට මාරු කර තිබුණි.

3.2 නිෂ්ක්‍රිය වත්කම්

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහජන පොළ ගොඩනැගිලි සංකීර්ණයේ තිබෙන කඩ කාමර 42 කින් 12 ක් බදු දීම සඳහා අවශ්‍ය කටයුතු නොකර වර්ෂයක පමණ කාලයක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) වලත්තාපිටිය පොළ ගොඩනැගිල්ල සහ ඊහා සම්බන්ධ කඩ කාමර ද මල්වත්ත පොළ ගොඩනැගිල්ල ද බදු දීම සඳහා අවශ්‍ය කටයුතු නොකර මාස 08 කට වඩා වැඩි කාලයක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පාලනය
------------------------

දැයට කිරුළ වැඩ සටහන යටතේ සමාලෝචිත වර්ෂයේදී මල්වත්ත පොළ ගොඩනැගිල්ල අළුත් වැඩියාකර නිම කළ වැඩ කොටස් සඳහා කොන්ත්‍රත්කරු ඉදිරිපත්කළ බිල අනුව වැඩ 04 ක් සඳහා කොන්ත්‍රාත්කරු රු. 347,217 ක මුදලක් ඉල්ලා තිබූ අතර රු. 429,587 ක මුදලක් ගෙවීම්කර තිබුණි. ඒ අනුව රු. 82,370 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

එක් එක් පළාත් පාලන ආයතන තම තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තියෙන් විධිවිධාන සලසා තිබුණ ද සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රත් පාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) ඇයවැය පාලනය

(ඊ) වීථි ලාම්පු නඩත්තු